**வாசிப்பு மேம்பாட்டிற்கான மாதிரிச் சமூக அமைப்பாக நூலக விழிப்புணர்வு நிறுவகம்**

**1. நூலக விழிப்புணர்வு நிறுவகத்தின் தோற்றம்**

நூலகங்கள், தகவல் நிறுவனங்கள், ஆவணவாக்க நிலையங்கள் போன்றவற்றைச் சமூகப் பயன்பாட்டுக்கு உதவக்கூடிய அறிவு ஆற்றல், அனுபவம் என்பவற்றை வளர்த்தெடுக்கக்கூடிய தகவல் மையங்களாக மாற்றுவதை நோக்கமாகக் கொண்டு உருவாக்கப்பட்டதே நூலக விழிப்புணர்வு நிறுவகம். இவ்வுச்சப் பயன்பாட்டினை எய்துவதற்கு, ஒருமுகப்படுத்தப்பட்ட, ஒன்றிணைந்த, செயலூக்க அணியாகச் செயற்பட விரும்புகின்ற அனைவரையும் இணைத்து 2005ம் ஆண்டு மே மாதம் 18ம் நாள் இந் நிறுவகம் தோற்றுவிக்கப்பட்டது. அறிவின் எல்லையைத் தாண்டிய சுயசிந்தனைக்கும் தேடலுக்கும் ஆதார சுருதியாக அமையக்கூடிய வாசிப்புப் பழக்கத்தை உருவாக்குவதற்கும் விருத்தி செய்வதற்கும் தேவையான அனைத்து வளங்களையும் ஒன்றிணைப்பதனூடாக உயிர்ப்புடைய மனிதம் மிக்க சமூகத்தைத்

தோற்றுவிக்க ஒன்றிணைதலே இவ்வமைப்பின் தொலைநோக்காகும் என்பது இதன் அங்குரார்ப்பணக் கூட்ட அறிக்கையிலிருந்து அறியவருகிறது.

**2. நூலக விழிப்புணர்வு நிறுவகத்தின் இலக்குகள்**

சமூகப் பயன்பாட்டுக்கு உதவக்கூடிய அறிவு, ஆற்றல், அனுபவம் என்பனவற்றை வளர்த்தெடுக்கக்கூடிய தகவல் மையங்களை உருவாக்குதலும், சுய கற்கை நிலையங்களாகத் தொழிற்படுவதன் மூலம் அவற்றைச் சுயசிந்தனைக் களமாக மாற்றுவதற்கு வகை செய்தலும், நூலகங்கள், தகவல் நிறுவனங்கள் போன்றனவற்றின் உருவ, உள்ளடக்கக் கட்டமைப்புகளைச் சகல வழிகளிலும் மேம்படுத்துவதற்கு ஆவன செய்தலும், இவற்றினை நிலைநிறுத்துவதற்கும், விருத்தி செய்வதற்கும் ஏற்ற ஆளணியினரை உருவாக்குதலும் அவற்றுக்குத் தேவையான சகல வளங்களையும் வழங்குதலும், அவற்றைச் சிறப்பான வகையில் கையாளுவதற்குரிய பயிற்சிப் பட்டறைகளை நடாத்துதலும், தகவல் சமூகத்தின் தேவைகளை நிறைவு செய்யும் களமாகவும் தகவல் வள உருவாக்கம், ஒழுங்கமைப்பு ஆகியவற்றுக்கான தளமாகவும் தொழிற்படலும் இவ்வமைப்பின் பொதுவான இலக்குகளாக வைத்தெண்ணத்தக்கன. (நூலக விழிப்புணர்வு நிறுவக பிரசுரம்)

**3. நூலக விழிப்புணர்வு நிறுவகத்தின் செயற்பாடுகள்**

இதன் பொதுவான செயற்பாடுகளாக சமூகத்தின் அடிமட்ட நிலையிலிருந்து வாசிப்புப் பழக்கத்தை உருவாக்குதல் அதன் அவசியத்தை வற்புறுத்தல், சிறுபிராயத்திலிருந்தே வாசிப்புப் பழக்கத்தை ஊக்குவிப்பதற்கான அனைத்து வழிவகைகளையும் கண்டறிந்து நடைமுறைப்படுத்தல், தனிமனித, குடும்ப, சமூக மட்டத்தில் வாசிப்பதற்கான தடைகளை இனங்காணல் அவற்றை நீக்குவதற்குரிய வழிகளை ஏற்படுத்துதல், சனசமூக நிலையங்கள், கல்வி நிறுவனங்கள் உட்பட சகல நிறுவனமயப்பட்ட சமூக நிறுவனங்களினூடாக வாசிப்புப் பழக்கத்தை விருத்தி செய்வதற்கான சகல நடைமுறைகளையும் ஏற்படுத்துதல், உள்ளூர், பிரதேச, தேசிய மட்டத்தில் தகவல் நிறுவனங்கள் தொடர்பான தரவு வங்கி ஒன்றினை நிர்மாணித்தல் என்பனவும் தேசிய ரீதியில் நூலகங்கள், தகவல் நிறுவனங்களின் உட்கட்டமைப்பு மற்றும் சேவைகள் தொடர்பாக ஆலோசனை வழங்குதல்; உரிய முறையில் அமைய ஆவன செய்தல்; நூலகங்கள், தகவல் நிறுவனங்களில் கடமை புரிவோருக்கு, பயிற்சிப் பட்டறைகள், கருத்தரங்குகளை நடாத்துதல்; அவர்களின் சிரமங்கள், தடைகளைப் பகிர்ந்து கொள்வதற்கான வாய்ப்பினை வழங்குதல்; உள, உடநலப் பாதிப்புற்றோரின் அறிவு விருத்திக்கு ஏற்றவகையில் தகவல் வளங்களைக் கட்டியெழுப்புதல்; நூலகவியல் சார்ந்த தகவல் வளங்களின் உற்பத்தியையும் வெளியீட்டினையும் ஊக்குவித்தல்; உள்ளூர், பிரதேச ரீதியில் வெளியிடப்படும் தகவல் வளங்களின் விபரங்களைச் சேகரித்துத் தொகுத்தல்; தொழினுட்பத் தொடர்பு ஊடகங்களின் உட்கட்டமைப்பை நிறுவி அவை தொடர்பான அறிவினை விருத்தி செய்தல்; தேசிய, சர்வதேச தகவல் வலைப்பின்னல்களுடன் தொடர்புகளைப்பேணல்; தகவல் தொடர்பாடல் தொடர்பான கருத்தரங்குகள், பயிற்சிப் பட்டறைகள், கண்காட்சி போன்ற நிகழ்ச்சித் திட்டங்களைக் காலத்துக்குக் காலம் நடாத்துதல் ஆகியவற்றைக் குறிப்பிடலாம். (நூலக விழிப்புணர்வு நிறுவக செய்திக்குறிப்பு)

**4. நூலக விழிப்புணர்வு நிறுவகத்தின் செயலணிகள்**

வாசிப்பு மேம்பாட்டுக் குழு, வள அபிவிருத்திக் குழு, நூலக ஒழுங்கமைப்புக் குழு, ஆளணி அபிவிருத்திக் குழு, வெளியீட்டுக் குழு ஆகிய செயலணிகளைக் கொண்ட இந்நிறுவகம் அகலத் திறக்கும் தகவற் சேவைகளின் நுழைவாயில்களை மூடிவிடாமல் பலதரப்பட்ட செயற்திட்டங்களின் வழியாக அவற்றைச் சமுகமயப்படுத்தி வருகிறது. வரையறுக்கப்பட்ட நிதி, வள வசதிகளுடன் இப்பணி சிரமமானதொன்றேயாயினும் சமூக மேம்பாட்டை மாத்திரம் முதன்மைப்படுத்தியே இத்தகைய திட்டங்களை அது அறிமுகம் செய்துவருகின்றது. தன்னை வளங்களாலும் சேவைகளாலும் வளர்த்தெடுத்து வரும் அதேசமயம் அதனால் முன்னெடுக்கப்படும் பல்வேறு செயற்திட்டங்களில் வாசிப்பினூடான தேசிய அபிவிருத்திக்கு வழிகாட்டவல்ல மாதிரிச் செயற்திட்டங்கள் சிலவற்றினை நோக்குவோம். (நூலக விழிப்புணர்வு நிறுவக செய்திக்குறிப்பு)

**5. நூலகக் கண்காட்சி**

'சிந்தனைப் பதிவேடுகள் அன்றும் இன்றும்' என்ற தலைப்பில் யாழ் மாவட்டத்தில் 30க்கும் மேற்பட்ட பாடசாலைகளில் நடமாடும் நூலகக்

கண்காட்சியை ஒழுங்குபடுத்தியதன் வாயிலாக சான்றாதாரக் கல்வியின் முக்கியத்துவத்தையும் அதன் பயனையும் தெளிவாகக் கண்டுணர்ந்ததன் விளைவாக முப்பரிமாண நூலகம் என்ற புதிய கருத்துநிலையினூடாக வாசிப்பை மேம்படுத்தும் புதிய உத்தியை அறிமுகம் செய்துள்ளது. சுயகற்றல் செயற்பாட்டை இலக்கு வைத்து தகவலைக் கண்டறியும் பொருட்டு குறித்த பாடத் துறையில் பொருள் தரும் வகையில் ஒழுங்குபடுத்தப்பட்ட உருக்கள், ஆவணங்கள், தகவல்கள் என்ற மூன்று முக்கிய மூலகங்களை உள்ளடக்கி உருவாக்கப்பட்ட புதிய ஒரு கருத்துநிலையே முப்பரிமாண நூலகமாகும். பிரதேச வரலாற்றினை ஆவணப்படுத்தும் உருநிலை வளங்களின் சேர்க்கை ஒன்றினை கட்டியெழுப்புதலுக்கான அடிப்படை கட்டமைப்பினை உருவாக்குதலும் நூலகங்களை அதிகார பூர்வமான பண்பாட்டுக் காப்பகமாகத் தொழிற்பட வைத்தலும் மாணவர்களிடையே தகவல் வளப்பயன்பாடு தொடர்பான விழிப்புணர்வையும் தகவல் அறிவு விருத்தி நிலையை ஏற்படுத்தலும் இதன் பிரதான நோக்கங்களாகும். (செயற்திட்ட செய்திக்குறிப்பு)

### 6. ஆளணி வள மேம்பாடு சமூக மேம்பாட்டினை இலக்காகக் கொண்ட

தேசிய அபிவிருத்திக்கான புதிய பாதையில் நூலக சேவையினை நகர்த்திச் செல்வதற்கான புதிய நுழைவாயில்கள் இன்று நூலகம் என்ற எல்லை தாண்டி விரிகின்றநிலையில் இந்நிறுவகமானது நூலகங்கள் மற்றும் தகவல் நிறுவனங்களில் கடமை புரிவோருக்கு, பயிற்சிப் பட்டறைகள், கருத்தரங்குகளை நடாத்துதல், அவர்களின் சிரமங்கள், தடைகளைப் பகிர்ந்து கொள்வதற்கான வாய்ப்பினை வழங்குதல் நூலகக்கல்வியில் அவர்களை மேம்படுத்தல் ஆகியவற்றை இலக்காகக்கொண்டு பொதுநூலக மற்றும் ஆசிரிய நூலகர்களுக்கு பயிற்சிப் பட்டறைகளை ஒழுங்குபடுததி நடாத்தியுள்ளது. குறிப்பாக வலிகாமம் தென்மராட்சி வடமாரட்சி போன்ற வலயங்களைச்சேர்ந்த ஆசிரியநூலகர்களுக்கான செயலமர்வுகள் குறிப்பிடத்தக்கன. (செயற்திட்ட செய்திக்குறிப்பு)

### 7. நூல் வெளியீடுகள்

கண்டவை, கேட்டவை, படித்தவை, உணர்ந்தவை எனப் புலன்களால் பெற்ற அறிவை புலனுக்குப் புறம்பாக உள்ள பகுத்தறிவின் துணைகொண்டு அலசி ஆராய்ந்து, ஒப்புநோக்கி, உண்மை கண்டு, புதிய கருத்துக்களை உருவாக்கி, அவற்றை மேலும் ஆய்வுசெய்து, சரிபார்த்து, கோட்பாடு காணும் இன்றைய காலகட்டத்தில் நூலகவியல் சார்ந்த தகவல் வளங்களின் உற்பத்தியையும் வெளியீட்டினையும் ஊக்குவித்தலின் பொருட்டு நூலகவியல் சார்ந்து “நூலகப்பகுப்பாக்கம் -ஒரு கைந்நூல்”; “சொற்கருவூலம்” ஆகிய இருநூல்களையும் இவ்வமைப்பு வெளியீடு செய்துள்ளது. இது தவிர தகவல் வளங்களின் சுருக்கவிபரணத்தை படங்களுடன் விபரிக்கும் தகவல் பிரபஞ்சம் என்ற சுவரொட்டியையும் இது அறிமுகப்படுத்தியுள்ளது. (செயற்திட்ட செய்திக்குறிப்பு)

### 8. தகவற் திறன் விருத்திக்கான போட்டிகள்

வளர்ச்சிகண்டுவரும் கல்வித்துறையில் தகவற்பெருவெளியிலிருந்து சரியான தகவல்களைப்பெறும் வழிவகைகளையும் உத்திகளையும் அறிமுகம் செய்ய வேண்டியது நூலக சமூகத்தினரின் தலையாய கடமையாகும். தனது சமுகச்சூழலில் அனைவரினதும் தகவற் தேவையைப் பூர்த்திசெய்வதற்கேற்ற வழிகளை இனங்காணலும் தகவற்சுதந்திரத்தைப் பேணலும் கிடைக்கும் அரிய தகவல்களை ஆவணப்படுத்தலும் நூலகத் துறைசார் நிறுவனங்களின் செயற்பாடுகளுள் இன்றியமையாதன. இவ்வகையில் யாழ் குடாநாட்டு பாடசாலைக் கல்வி பெறும் மாணவரிடையே நூலகப் பயன்பாடு, வாசிப்பு, ஆவணப்படுத்தல், ஆக்கத் திறன், சுயஆளுமைத் திறன் ஆகியவற்றை மேம்படுத்தும் நோக்குடன் நூலக விழிப்புணர்வு நிறுவகம் பொதுஅறிவு மற்றும் ஆக்கத்திறன் சார் போட்டிகளை நடாத்தியுள்ளது. (செயற்திட்ட செய்திக்குறிப்பு)

### 9. வாசிப்பின் சுவைகூட்டும் கருத்தாடல்கள்

சமூக உணர்வுடைய மனிதன் உருவாக வாசிப்பு உதவுகின்றது. நல்ல நூல்களின் பரிச்சயம் காலப்போக்கில் சமுதாயத்தில் அறிவின் பெருக்கத்தை ஏற்படுத்தியே தீரும் என்ற நம்பிக்கையுடன் நூலக விழிப்புணர்வு நிறுவகம் அறிமுகப்படுததியிருக்கும் செயற்திட்டங்களில் ஒன்று தான் “ நூலுக்கு ஒரு மாலை ” நிகழ்வு ஆகும். நூலக விழிப்புணர்வு நிறுவகத்தின் உப குழுவான வாசிப்பு மேம்பாட்டுக் குழு பொது நூலகங்கள், பாடசாலைகள், ஏனைய பொது நல அமைப்புகள் போன்றவற்றினூடாக இந்நிகழ்வை

முன்னெடுக்கிறது. கல்விச் சமூகம், பெற்றோர், பொதுமக்கள் என அனைத்துத் தரப்பினரையும் கொண்டதாக, ஒரு மாலைப் பொழுதில் ஒரு "நல்ல" நூலை, அதனைப் படித்துச் சுவைத்த ஒரு "நல்ல " வாசிப்பு உணர்வுடைய ஒருவரைக் கொண்டு, அவரின் ரசனை அனுபவத்தை வெளிப்படுத்தும் வாய்ப்பை வழங்கி, அதனூடாக ஏனையவர்களையும் அந்நூலைத் தேடி வாசிக்கத் தூண்டும் விதமாகக் கூறவைக்கும் நிகழ்வாக " நூலுக்கு ஒரு மாலை " நிகழ்வு அமைகின்றது. இங்கு " மாலை நேரத்தில் ஒரு நூல் " என்ற கருத்துத் தொனிக்கும் அதே சமயம், மாலையிட்டு மரியாதை செய்யவல்ல கருத்துக்களை மனத்தில் இழையவிடக்கூடிய "மதிப்பு மிக்கநூல்" என்ற தொனிப்பொருளும் உடனமைவதைக்காணலாம். (செயற்திட்ட செய்திக்குறிப்பு)

**முடிவுரை**

அபிவிருத்தியடைந்துவரும் உலகச் சூழ்நிலையில் சவால்களுக்கு முகம்கொடுத்து சேவை வழங்கும் இன்றைய நூலகர்களுக்கும் நூலகத்துறைக்கும் பயன்தரும் நோக்கில் மேற்கொள்ளப்பட்ட இம்முயற்சி நூலகத்தகவல் அறிவியல்துறையின் சமகால போக்கினை அனைவர்க்கும் அறிவிப்பதற்கு ஏற்ற வழியாக அமையும். எம்முன் காலக்கடமையாய் விரியும் பாரிய இப்பணிக்காக நாம் தரக்கூடிய முதன்மையான பங்களிப்பு நம்பிக்கையுடனான உணர்வுபூர்வமான ஒத்துழைப்பேயாகும். துறைசார் புலமையாளர்களின் காத்திரமான ஆலோசனைகளையும் கருத்தாடல்களையும் பெற்று தகவல் பயன்பாட்டின் பெறுமதியை உணர்த்தும் வகையில் அமைந்த சமுகஅமைப்புக்களை பிரதேசமட்டத்தில் உருவாக்கி அவற்றைப் பிராந்திய ரீதியில் ஒன்றிணைத்து செயற்படுத்தி வாசிப்பினூடான சமுக தேசிய அபிவிருத்திக்காக நூலகங்களோடு இணைந்து பணியாற்றவல்ல வலுவான சமுக கட்டமைப்புக்களை உருவாக்கவேண்டியதே இலங்கையின் நூலகத்துறையின் சமகால செயல்நெறியில் விரைந்து முடிக்கவேண்டிய பணியாக அமைகின்றது.

website address of Foundation for Library Awareness
https://sites.google.com/site/foundationforlibraryawareness/

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පොත් බැදුම් ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපෘතිය - 2012

මිල ගණන් විස්තරය ප්‍රධාන පොත් බැදුම් ද්‍රව්‍ය කට්ටලය

| පොත් බැදුම් ද්‍රව්‍ය | ද්‍රව්‍ය ප්‍රමාණය | |
|---|---|---|
| • රෙක්සින් | මීටර් | 05 |
| • කෙම්ෆික්ස් | කිලෝ | 01 |
| • නූල් පන්දු | | 01 |
| • චීජ් බෝඩ් | | 25 |
| • කාට්රිජ් කොළ | | 20 |
| • සුදු රෙදි | මීටර් | 20 |
| • කාකි රෙදි | මීටර් | 01 |
| • ලෙදරෙට් කොළ | | 02 |
| • එතුම් කොළ | | 05 |
| • මාබල් කොළ | | 05 |

• ප්‍රධාන පොත් බැදුම් ද්‍රව්‍ය කට්ටලය අලෙවිකරනු ලබන මිල රු.4500 - කි

පොත් බැදුම් ද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණයක් පහත දක්වා ඇති ප්‍රමාණයන්ගෙන් හා එහි ගුණිතවලින් මිල දී ගැනීමට පහසුකම් සලසා ඇත.

| | | | |
|---|---|---|---|
| • රෙක්සින් | මීටර් 05 | රු. | 2775.00 |
| • කෙම්ෆික්ස් | කිලෝ 01 | රු. | 405.00 |
| • නූල් පන්දු | 01 | රු. | 150.00 |
| • චීජ් බෝඩ් | 25 | රු. | 575.00 |
| • කාට්රිජ් කොළ | 20 | රු. | 200.00 |
| • ලෙදරෙට් කොළ | 02 | රු. | 180.00 |
| • එතුම් කොළ | 05 | රු. | 25.00 |
| • මාබල් කොළ | 05 | රු. | 17.00 |

පොත් බැදුම් උපකරණ කට්ටලයක
මිල - රු.1500.00

**පොත් බැදුම් උපකරණ කට්ටලයක අන්තර්ගත** ද්‍රව්‍ය : වානේ කතුර (අගල් 9) ප්‍රිමින් පිහිය, බෝඩ් කිණිය, බැදුම්කරු මිටිය, වානේ රූල (අඩි 2)ල පින්සලය, ප්ලාස්ටික් කෝප්පය සහ ඉදිකටුව

# මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම
# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම හා පුස්තකාල සංවර්ධනයට උපදෙස් ලබා දීම සිදු කෙරේ. තුන්වන ශ්‍රේණියේ පුස්තකාල හැර අනෙකුත් පුස්තකාල අදාළ ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඇගැයීම් වාර්තාවක් ලබා ගැනීම වෙනුවෙන් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතු වේ.

- අධි ශ්‍රේණිය සඳහා පුස්තකාලයක් සමීක්ෂණය කිරීම වෙනුවෙන් - රු. 5000.00
- පළමු ශ්‍රේණිය සඳහා පුස්තකාලයක් සමීක්ෂණය කිරීම වෙනුවෙන් - රු. 4000.00
- දෙවන ශ්‍රේණිය සඳහා පුස්තකාලයක් සමීක්ෂණය කිරීම වෙනුවෙන් - රු. 2500.00
- තෙවන ශ්‍රේණිය සඳහා පුස්තකාලයක් සමීක්ෂණය කිරීම වෙනුවෙන් - රු. 500.00

02. පළාත් පාලන කොමසාරිස්වරයාගේ නිර්දේශ සහිතව සේවා ගාස්තුව ද සමග කරනු ලබන ඉල්ලීම අනුව මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම සිදු කරනු ලැබේ. ශ්‍රේණිගත කරවා ගැනීමට බලාපොරොත්තුවන පුස්තකාල අපේක්ෂිත ශ්‍රේණියට නියමිත ප්‍රමිති සපුරා තිබිය යුතුය.

03. ශ්‍රේණිගත කිරීමෙන් අනතුරුව විධිමත් සහතිකපතක් ලබාදීමට කටයුතු කෙරේ. ඒ සඳහා වැයවන මුදල රු.500.00 කි. ඉහත ගාස්තුවට අමතරව එය ගෙවිය යුතුය.

04. ඔබ පුස්තකාලය ශ්‍රේණිගත කිරීමට අවශ්‍ය නම් එම ශ්‍රේණියට අදාළ ගාස්තුව ගෙවා ඉල්ලීමක් කළයුතු අතර, එම මුදල චෙක්පතක් මගින්. “අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය” යනුවෙන් සඳහන් කොට යොමු කළ යුතු වේ.

# ද්විතීයික තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් "Current Contents" හි වැදගත්කම

**සේනානි දීපිකා බණ්ඩාර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ)
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

අද්‍යතන ලෝක තත්ත්වය සලකන විට කැපී පෙනෙන ප්‍රවණතාවක් වන්නේ තොරතුරු උත්පාදන වේගය ශීඝ්‍රයෙන් වර්ධනය වීමයි. එබැවින් එය තොරතුරු මත යැපෙන තොරතුරු සමාජයක් ලෙස නිර්වචනය කළ හැකිය. තනි පුද්ගලයන් හා ආයතනික මට්ටමින් ලෝකයේ විවිධ ක්ෂේත්‍රයන්හි සිදුවන පර්යේෂණ ප්‍රමාණය දිනෙන් දින වර්ධනය වේ. මෙම තත්ත්වය හමුවේ තොරතුරු අවශ්‍ය පුද්ගලයා හා තොරතුරු අතර විශාල පරතරයක් පවත්නා බැවින් තොරතුරු වෙත ළඟාවීම සඳහා ක්‍රමානුකූලව හා විද්‍යාත්මකව සැකසුණු ක්‍රමයක් නොවේ නම් එම තොරතුරු සොයා යාම විශාල කාලයක් හා ශ්‍රමයක් වැය කළ යුතු අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙන කාර්යයක් බවට පත් වේ. මෙයට විසඳුමක් ලෙස ඕනෑම ක්ෂේත්‍රයක පර්යේෂකයන් හට තම විෂය ක්ෂේත්‍රයන් හි ජගත් පරිමාණයෙන් සිදුවන නව සොයා ගැනීම් හා පර්යේෂණ තොරතුරු කරා කඩිනමින් ළඟාවිය හැකි ප්‍රවේශ මාර්ග ලෙස ද්විතීයික මූලාශ්‍ර බිහිවීම සිදුවේ. මෙම ද්විතීයික මූලාශ්‍ර ගණයට අනුක්‍රමණිකා (Indexes) සාර සංග්‍රහ (Abstracts) නාමාවලි (Bibliographies) හා ග්‍රන්ථ විචාර (Reviews) අයත් වේ. ද්විතීයික මූලාශ්‍ර මගින් ප්‍රාථමික මූලාශ්‍රවල සඳහන් තොරතුරු වෙත මඟ පෙන්වීමක් සිදු කරයි. ප්‍රාථමික මූලාශ්‍ර ලෙස සලකනු ලබන්නේ සෘජුවම තොරතුරු වෙත ළඟා විය හැකි මාධ්‍යයන් වන වාර සඟරා ලිපි, වාර්තා, පර්යේෂණ, නිබන්ධන, පේටන්ට් ප්‍රකාශන, සමුළු වාර්තා යනාදියයි.

අද ලෝකයේ පරිගණක තාක්ෂණ හා සන්නිවේදන අංශයන්හි ඇති වී ඇති දැවැන්ත දියුණුවත් සමග ද්විතීයික මූලාශ්‍ර සම්පාදනය මෙම කාර්යයෙහි වගකීම සාම්ප්‍රදායිකව හිමිවිය යුතු පුස්තකාල ක්ෂේත්‍රයෙන් පරිබාහිරව අන්තර්ජාතික ආයතන මගින් තරගකාරීව සිදුකිරීමක් දක්නට ලැබේ. විවිධ ස්වරූපයෙන් ප්‍රකාශයට පත්වන තොරතුරු මූලාශ්‍ර පර්යේෂකයන්ට මෙන්ම වෙනත් සියලුම උපයෝජකයන්ට පහසුවෙන් දැන ගැනීමට මෙන්ම එම ප්‍රකාශන කරා කඩිනමින් ප්‍රවේශවීම සඳහා අවශ්‍ය ක්‍රමානුකූල හා සංවිධානාත්මක ව්‍යුහයක් සැකසීම මෙම ආයතනයන්ගේ කාර්යභාරය වේ. තොරතුරු මූලාශ්‍ර එළි දක්වන ප්‍රකාශකයින් හා ඇතිකරගනු ලබන ගිවිසුම් මගින් තොරතුරු පද්ධති හා ජාල හරහා ගනු ලබන නවතම පර්යේෂණ තොරතුරු වෙත උපයෝජකයා මෙම ද්විතීයික මූලාශ්‍ර මගින් එකිනෙක යා කිරීමක් සිදු වේ. ලෝකයේ මෙවැනි ද්විතීයික මූලාශ්‍ර නිෂ්පාදනයේ යෙදී සිටින ප්‍රමුඛ පෙළේ ආයතන කිහිපයක් ඇති අතර, එයින් විෂයයන් විශාල ප්‍රමාණයක් ආවරණය කෙරෙමින් මූලාශ්‍ර නිෂ්පාදනයේ යෙදී සිටින ආයතනයක් ලෙස ඇමරිකාවේ පිලදෙල්පියාහි ISI (Institute for Sciencetific Information) ආයතනය හැඳින්විය හැකිය. මෙහි ද්විතීයික මූලාශ්‍ර සම්පාදනයේ එක් ග්‍රන්ථ විඥාපන සේවාවක් ලෙස "Current Contents" සැලකේ.

මෙම "Current Contents" ද්විතීයික මූලාශ්‍ර අතරින් සාර සංග්‍රහ (Abstract) ගණයට අයත් වේ. විෂය ක්ෂේත්‍ර කිහිපයකට අයත් ලොව ප්‍රමුඛ පෙළේ විද්වත් වාර සඟරාවන්හි (Scholary Journals) පළ වන අලුත්ම පර්යේෂණාත්මක තොරතුරු වෙත මඟ පෙන්වීමක් මෙමගින් සිදු වේ. වර්තමාන ලෝකයේ විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම සන්නිවේදනය සඳහා ඇති ප්‍රධාන මාධ්‍ය ලෙස සලකනු ලබන්නේ විද්වත් එසේ නැත්නම් ශාස්ත්‍රීය වාර සඟරාවන්ය. වාර සඟරා අලුත්ම දැනුම සන්නිවේදනය කරන, අත්දැකීම් හුවමාරු කර ගන්නා, අලුත් අදහස්, නව සොයා ගැනීම් ප්‍රචාරය කරනු ලබන වේදිකාවක් වැනිය. පොතකට වඩා ඉක්මනින් නවතම තොරතුරු ලබාගත හැකි පහසු මාර්ගයක් වීමත්, ඉක්මනින් සඟරා ලිපියක් කියවා අදහස් ලබා ගැනීමට හැකිවීමත්, වාර සඟරාවන්හි ලිපි සාධිකාරි බවින් යුතු වීමත්,. විශිෂ්ට තොරතුරු ලබාගත හැකිවීමත්, පර්යේෂණ සිදුකළ යුතු අංශ හා තේමාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වීමත් යන හේතූන් මත වාර සඟරා, තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් ඉතා වැදගත් වේ. "Current Contents" හි ඇතුළත් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරුවලින් 75% ක් පමණ ආවරණය කරනු ලබන්නේ වාර සඟරා මගිනි. මෙම විද්වත් වාර සඟරාවන්හි ලිපි ද ද්විතීයික මූලාශ්‍රවලට ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේදී එම සඟරා වර්ගීකරණයකට ලක් කිරීමක් සිදු කරනු ලබයි. මේ නිසා ලෝකයේ විවිධ ක්ෂේත්‍රයන්හි පළවන ශාස්ත්‍රීය ලිපි හා නව සොයා ගැනීම් ඇතුළත් සෑම වාර සඟරාවක්ම හා ලිපියක්ම මේ සඳහා ඇතුළත් කර නොගැනේ. ISI ආයතනය මගින් ප්‍රකාශ කරනු ලබන ද්විතීයික මූලාශ්‍ර ප්‍රකාශන සඳහා පොදු මෙන්ම ඒ ඒ ප්‍රකාශන සඳහා විශේෂ වූ තත්වකරණ සීමාවක් ඇත. ඒ අනුව වාර සඟරාවන්හි ඇතුළත් වන තොරතුරු වල ස්වයං නිර්මාණාත්මකභාවය, නිරවද්‍යතාව, ගුණාත්මකභාවය යන කරුණු සැලකිල්ලට ගනිමින් පර්යේෂණ ලිපිය ඉදිරිපත් වන අදාළ විෂය ක්ෂේත්‍රයේ විශේෂඥයන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු යටතේ හෝ සිදුවන අනුමැතිය ලැබීමෙන් අනතුරුව පළ කෙරෙන ලිපි

ඇතුළත් වාර සඟරා උසස්ම මට්ටමේ වාර සඟරා ගණයට අයත් වේ. මීට අමතරව මෙම විද්වත් වාර සඟරා නියමිත කාලය තුළ ප්‍රකාශයට පත්වීමද අනිවාර්ය සාධකයක් ලෙස සලකනු ලබයි. දියුණු වෙමින් පවත්නා බොහෝ රටවල ඇතැම් වැදගත් වාර සඟරා තොරතුරු මෙම ද්විතීයක මූලාශ්‍ර සඳහා ඇතුළත් නොවන්නේ කාලීනව පළ නොවන බැවිනි. "Current Contents" සඳහා ඇතුළත් කරගනු ලබන ප්‍රාථමික මූලාශ්‍ර තොරතුරු ස්වයං නිර්මාණාත්මක, නිරවද්‍යවීම, ගුණාත්මක අතින් මෙන්ම කාලීනව ප්‍රකාශවීම ද අනිවාර්ය සාධක බැවින් අන්තර්ගතය සලකන විට ඇතුළත් තොරතුරු අනුව "Current Contents" උසස් මට්ටමක තොරතුරු විඥාපන සේවාවක් වශයෙන් හැඳින්විය හැකිය.

**විෂය ආවරණය**

ද්විතීයික මූලාශ්‍රයක් වශයෙන් "Current Contents" සලකා බැලීමේ දී එහි උසස් තත්වකරණ මට්ටම කෙරෙහි බලපාන ඉහත දක්වන ලද ආවරණය වන ප්‍රාථමික මූලාශ්‍රවල ප්‍රමිතියට අමතරව සඳහන් කළ හැකි තවත් සාධකයක් වන්නේ මෙයින් ලෝකයේ සෑම ප්‍රධාන විෂය ක්ෂේත්‍රයක්ම අවාරණය කිරීමයි. "Current Contents" මගින් ප්‍රධාන විෂයයන් 07ක් ආවරණය කරමින් සංස්කරණ එළි දැක්වේ. මෙම ප්‍රධාන විෂයයන් 07 යටතේ විස්තර අන්තර්ගත වන සම්පූර්ණ වාර සඟරා ප්‍රමාණය 8000ක් වන අතර ග්‍රන්ථ ප්‍රමාණය 2000ක් පමණ වේ. "Current Contents" මගින් මූලාශ්‍ර එළි දැක්වෙන විෂයයන් හා ඒ ඒ විෂයයන් සඳහා ඇතුළත් වාර සඟරා ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

(1) කෘෂිකර්මය, ජීව විද්‍යාව හා පාරිසරික විද්‍යාව (Agriculture, Biology & Enviromental Science) විද්වත් වාර සඟරා 1,040ක තොරතුරු ඇතුළත්ය.

(2) කලා හා මානව ශාස්ත්‍ර (Arts & Humanities) විද්වත් වාර සඟරා 1,120ක හා ග්‍රන්ථ ලිපි ඇතුළත්ය.

(3) සායනික වෛද්‍ය විද්‍යාව (Clinical Medicine) පොත් හා විද්වත් වාර සඟරා 1,120ක තොරතුරු ඇතුළත්ය.

(4) ඉංජිනේරු පරිගණක හා තාක්ෂණ විද්‍යා (Engineering, Computing & Technology) විද්වත් වාර සඟරා 1,110 ක ග්‍රන්ථ තොරතුරු ඇතුළත්ය.

(5) ජෛව විද්‍යා (Life Science) විද්වත් වාර සඟරා 1,370ක් ආවරණය කරයි.

(6) භෞතික, රසායන විද්‍යා, භූවිද්‍යා (Physical, Chemical & Earth Sciences) විද්වත් වාර සඟරා 1,050 ක හා ග්‍රන්ථ විචාර ඇතුළත්ය.

(7) සමාජ හා ආචාර විද්‍යාව (Social & Behavioural Science,) විද්වත් වාර සඟරා 1,620ක් හා ග්‍රන්ථ විචාර ඇතුළත්ය.

**ප්‍රකාශන මාධ්‍ය**

"Current Contents" ද්විතීය මූලාශ්‍රයක් වශයෙන් උපයෝජකයන්ගේ පහසුව සඳහා මාධ්‍ය 3කින් නිෂ්පාදනය කරනු ලබයි. මේ නිසා පුස්තකාල හෝ අවශ්‍ය ආයතන මට්ටමින් ඒවා සතු මූල්‍ය ප්‍රතිපාදන මත හා පාඨක ඉල්ලුමට සරිලන පරිදි තමන් කැමති මාධ්‍යයක් තෝරා ගැනීමේ හැකියාව ඇත.

(1) මුද්‍රිත වෙළුම් (Printed Version)

(2) සංයුක්ත තැටි (CD/DVD )

(3) මාර්ගගත දත්ත පදනම් (Online databases)

මීට අමතරව දැනට වසර ගණනාවකට පෙර ඩිස්කට් මාධ්‍යයෙන් මෙම තොරතුරු එළි දැක්විණි. (CCOD) (Current Contents On Diskettes)

මෙම නිෂ්පාදන අතර ඇති වෙනස වන්නේ එකම තොරතුර ගවේෂණ, පහසුකම් අඩු වැඩි වශයෙන් යුතුව සම්පාදනය වීමයි.

මෙහි මුද්‍රිත සංස්කරණ මගින් තොරතුරු ගවේෂණයේ දී ගවේෂණ ක්ෂේත්‍රය 4කට සීමා වී ඇත.

1. පරිපූරක අනුක්‍රමණිකාව (Supplymentary Index) මෙහි වාර සඟරා, පටුන පිටු ඇතුළත් වේ.
2. ශීර්ෂ පද අනුක්‍රමණිකාව (Title Word Index)
3. කර්තෘ අනුක්‍රමණිකාව හා ලිපින නාමාවලිය (Author Index & Address Directory)
4. ප්‍රකාශකයින්ගේ නාමාවලිය (Publishers Address Directory) මෙමගින් ඇතුළත් පර්යේෂණ ලිපිවල සම්පූර්ණ පිටපත (Full Text) ලබා ගැනීම සඳහා යොමුවීමට මඟ පෙන්වයි.

සංයුක්ත තැටි මාධ්‍යයෙන් ගවේෂණය කිරීමේ දී එය ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයන් මගින් සැලසෙන පහසුකම් රාශියක් ලැබීම සිදුවේ. බූලියන් ගවේෂණ, ලෝපකරණ භාවිතය වැනි ක්‍රම තුළින්, ක්ෂණික හා පුළුල් ගවේෂණ කිරීමේ හැකියාව මෙන්ම ක්ෂේත්‍ර (Fields) ගණනාවන් යටතේ ගවේෂණය කළ හැකි වේ. එම ගවේෂණ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි වේ. Accession number, Title, Journal word, Author Keywords, Language, Entry week, Institution, Volume, Page, Author, Journal name, Abstract, Keyword, Plus, Publication type, CC Categories, Year of Publication, Issue/Part, Text word යනුවෙනි.

"Current Contents" මාර්ගගත දත්ත පදනම් මගින් ලබා ගැනීමේ දී ඉහත සංයුක්ත තැටි පදනමක් සඳහා ඇතුළත් වන පහසුකම් සියල්ම ඇතුළත් වන අතර ඊට වඩා වැඩි දායක මිලක් මේ සඳහා ගෙවිය යුතු වේ. විශ්වවිද්‍යාල වැනි එකවර පාඨකයින් විශාල සංඛ්‍යාවකට සේවය සැලසිය යුතු ආයතන විසින් මාර්ගගත ක්‍රමයට මෙහි සේවාවන් ලබා ගැනීම සඳහා වැඩි වශයෙන් යොමු වී ඇත.

ඉහත සංයුක්ත තැටි හා මාර්ගගත පදනම් ඉලෙක්ට්‍රොනික ගවේෂණ මාර්ග දෙක මගින්ම කර්තෘගේ විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) හා ප්‍රකාශකගේ නිවහන් පිටුව දක්වා ඇත. මේ නිසා උපයෝජකයාට අවශ්‍ය ලිපිවල සම්පූර්ණ පිටපත (Full text) ලබා ගැනීමේ දී කර්තෘ මගින් මුල් පිටපත් 25 නොමිලේ ලබා ගැනීමට ඇණවුම් කිරීමට හෝ ප්‍රකාශකගේ නිවහන් පිටුව හරහා මුල් පිටපත වෙත යොමු වීමේ පහසුකම් මෙමගින් සැලසේ. එය ද ද්විතීයික මූලාශ්‍රයක් ලෙස Current Contents හි විශේෂ ඇගයීමට ලක් කළ යුතු අංශයකි. ක්ෂණිකව ප්‍රාථමික මූලාශ්‍රය වෙත යොමුවීමේ පහසුකම Current Contents හි තරම් ISI ආයතනයේ ම වෙනත් ද්විතීයික මූලාශ්‍රවල ද ඇතුළත්ව නැත. ප්‍රකාශකගේ වෙබ් පිටුව හරහා මුල් මූලාශ්‍රය වෙත එම ගවේෂණ මොහොතේදීම සම්බන්ධ වීමේ දී ඇතැම් අවස්ථාවල දී පමණක් ක්‍රෙඩිට් කාඩ්පතක් මගින් මුදල් ගෙවා සම්පූර්ණ ප්‍රකාශනය ලබාගත යුතු වේ. මීට අවමතරව ISI ආයතනය මගින් "Current Contents" හි ඇතුළත් ප්‍රාථමික මූලාශ්‍ර ලේඛන සැපයීමේ සේවාව (Document Delivery Service) යටතේ සාධාරණ මිලකට දායකයින්ට අවශ්‍ය ලිපිය ඇණවුම් කර පැය 24ක් ඇතුළත ලෝකයේ ඕනෑම රටක් වෙත ලබාදීමේ සේවාවක් ක්‍රියාත්මක වේ. වෙනත් ද්විතීයික මූලාශ්‍ර සම්පාදන ආයතන මගින් ද මෙම මුල් ලේඛනය වෙත ප්‍රවිෂ්ට වීමේ පහසුකම් සලසා තිබීම දක්නට ලැබුණත්, මෙතරම් ක්‍රමානුකූලව හා සංවිධානාත්මක ආකාරයට එම දත්ත ඉදිරිපත් වීමක් හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි තත්වයක් නො පවති.

## සංස්කරණ කාලය

ද්විතීයික මූලාශ්‍රයන් ලෙස "Current Contents" ඇගයීමට ලක් කිරීමේ දී එහි සංස්කරණ කාල සීමාව ද විශේෂයෙන් වැදගත් වේ. මෙය සතිපතා සංස්කරණය වන බැවින් කාලීන පර්යේෂණ තොරතුරු ගවේෂණය සඳහා ඇති ප්‍රබල මූලාශ්‍රයක් ලෙස සැලකිය හැකිය. ලෝකයේ විවිධ ආයතන විසින් විවිධ ක්ෂේත්‍ර යටතේ පළ කරනු ලබන ද්විතීයික මූලාශ්‍ර අතරින් සතිපතා සංස්කරණයට ලක්වන මූලාශ්‍ර ප්‍රමාණය අතළොස්සකි. ඒ අතරට "Current Contents" ඇතුළත්වීම විවිධ විෂය ක්ෂේත්‍රයන්හි නවතම පර්යේෂණ තොරතුරු කරා තරඟකාරිව හඹා යන පර්යේෂකයන්ට, විශාල පිටිවහලක් වේ.

## සමාලෝචනය

මේ අනුව "Current Contents" සාර සංග්‍රහ සේවාව විෂය ක්ෂේත්‍ර කිහිපයක විශ්වඥානය ප්‍රතිග්‍රහණය, සංවිධානය හා එම තොරතුරු අවශ්‍ය පුද්ගලයන් වෙත යොමු කිරීමෙහිලා ද්විතීයික මූලාශ්‍රයක් ලෙස විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබයි. ප්‍රවීණ පුස්තකාලවේදිනී සුසිලා කුමාර් සඳහන් කර ඇති විමර්ශන සේවාවක් ලෙස ද්විතීයික මූලාශ්‍රයන් මගින් සැපයිය යුතු පහත සඳහන් සේවා "Current Contents" මගින් ආවරණය වෙයි.

(1) පර්යේෂණයන්හි විෂයාන්තර සම්බන්ධය ගොඩනැගීම

නූතන ලෝකයේ බොහෝ විෂයයන් ස්වාධීනව නොපවතින අතර ඒවායේ විෂයාන්තර සබඳතා පවතී.

"Current Contents" මගින් දක්වා ඇති ප්‍රධාන විෂයයන් 07 හි මෙම සබඳතාව මැනවින් පැහැදිලි වේ.

නිදසුන් ලෙස ඉංජිනේරු, පරිගණක හා තාක්ෂණ විද්‍යාවන් එක් කොටසකට වර්ග කිරීම දැක්විය හැකිය.

(2) විසිරී පවත්නා තොරතුරු එක්රැස් කිරීම ලෝකයේ විවිධ රටවල විවිධ ප්‍රාථමික මූලාශ්‍ර මගින් ප්‍රකාශයට පත්වන නවතම තොරතුරු මේ යටතේ එක් රැස්වීම සිදු වේ.

(3) තොරතුරුවල අඛණ්ඩ වර්ධනය පිළිබඳ පර්යේෂකයන් දැනුවත් කිරීම.

අද ලෝකයේ බිහිවන නව සොයා ගැනීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ ප්‍රබල මූලාශ්‍ර වන්නේ මෙවැනි සේවාවන්ය.

(4) පොත්පත්, වාර සඟරා ඇතුළු ප්‍රකාශන මිල අඛණ්ඩව ඉහළ යාමේ දී ඒ සඳහා සහනයක් වීම.

අද පර්යේෂකයන්ට මුහුණ දීමට සිදුව ඇති එක් ප්‍රධාන ගැටලුවක් වන්නේ ප්‍රකාශන මිල ඉහළ යාමයි. තමාට අවශ්‍ය වේලාවට අවශ්‍ය තොරතුරු අඩංගු ලේඛන මිල දී ගැනීමට මේ නිසා පර්යේෂකයන්ට දුෂ්කර වේ. මේ තත්ත්වයෙන් ඔවුන් මුදා ගන්නා ඉහත දක්වන ලද කරුණු අනුව ද්විතීයික මූලාශ්‍රයක් වශයෙන් "Current Contents" උසස් ඇගයුමකට ලක් කළ හැකි වේ. මෙම ද්විතීයික මූලාශ්‍ර සේවාව ශ්‍රී ලංකාවේ පුස්තකාල කිහිපයක් විසින් විවිධ කාලයන්හි ලබා ගැනීමට කටයුතු කර ඇත. ඒ අතරින් 1992 සිට

2005 වර්ෂය තෙක් ශ්‍රී ලාංකා ජාතික පුස්තකාලය විසින් මෙම විෂයයන් 07ම මිල දී ගත් අතර 2005 - 2007 දක්වා ජෛව විද්‍යාව හැර ඉතිරි විෂයයන් 06 මිල දී ගන්නා ලදි. එසේම විශ්වවිද්‍යාල හා ජාතික විද්‍යා පදනම වැනි ආයතන මගින් ඇතැම් කාලවලදි ඇතැම් විෂයයන් මිල දී ගැනීමට කටයුතු කර ඇත. නමුත් ප්‍රතිපාදන හිඟය හා උපයෝජක භාවිතය අඩුවීම වැනි හේතු මත මෙම ද්විතීයික මූලාශ්‍ර සේවාව මේ දක්වා අඛණ්ඩව සෑම විෂයක්ම ලබා ගන්නා ලද පුස්තකාලයක් ශ්‍රී ලංකාවේ නොමැත. එබැවින් මෙවන් උසස් තත්ත්වයේ මූලාශ්‍ර සේවාවන් ලබා ගැනීම හා ඒවා පර්යේෂකයන් අතර ජනප්‍රිය කරවීම සම්බන්ධයෙන් ඉදිරියේ දී පුස්තකාල විසින් අවධානය යොමු කිරීම පිළිබඳව සලකා බැලිය යුතුව ඇත.

### විමර්ශන

Thomson Reuters. 2011 Current Contents [Online] Available at http://thomsonreuters.com/products_services/science_products/a-z/current_content/ [Accessed on 02.11.2011

Current contents quick reference.Guide book, 1997'

Kumar, Krishan 1997. Referenc service, New Delhi: Vikas.

## ජාතික පුස්තකාලයේ පුවත්පත් හා ගැසට් පරිහරණ ගාස්තු

### පුවත්පත්

එක් දිනක දී සාමාන්‍ය පරිදි මාස 05 ක පුවත්පත් පරිශීලනය සඳහා ගාස්තුවක් අය නොකෙරෙන අතර ඊට අතිරේක සෑම මාසයක ම පුවත්පත් පරිශීලනය සඳහා රු.25.00ක් බැගින් සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.

### ගැසට්

එක් දිනක දී සාමාන්‍ය පරිදි මාස 05 ක ගැසට් පරිශීලනය සඳහා ගාස්තුවක් අය නොකෙරෙන අතර ඊට අතිරේක සෑම මාසයක ම ගැසට් පරිශීලනය සඳහා රු.35.00ක් බැගින් සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.

## බුත්සරණ නව සංස්කරණය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් විද්වත් මණ්ඩලයක් විසින් ක්‍රමානුකූලව සංස්කරණය කරන ලද දේශීය බෞද්ධ සාහිත්‍යයේ අග්‍රගන්‍ය කෘතියක් වන බුත්සරණ කෘතිය ළඟදීම නිකුත් වේ.

## ජාතික පුස්තකාල පුවත්පත් එකතුව පරිහරණය පිළිබඳ උපදෙස්

ජාතික පුස්තකාල පුවත්පත් එකතුව විශාල පෙට්ටිවල ආරක්ෂිතව රාක්ක මත තැන්පත් කර ඇති බැවින් පාඨකයින්ගේ ඉල්ලීම් අනුව ලබා ගැනීමේ දී හා ආපසු තැන්පත් කිරීමේ දී විශාල ශ්‍රමයක් වැය වේ. එබැවින් පුවත්පත්වලට ඇති ඉල්ලුමේ ප්‍රමාණය සහ එදින සේවය කරන නිලධාරි සංඛ්‍යාව අනුව පාඨකයින් සඳහා පුවත්පත් සැපයීමේ ප්‍රමාදයන් ඇති වීමට ඉඩ තිබේ. සාමාන්‍ය තත්වයන් යටතේ වුවද පාඨකයින්ගේ පරිහරණය සඳහා විශාල පුවත්පත් ප්‍රමාණයක් එකවර නිකුත් කිරීම අපහසු වේ. තමන්ට අවශ්‍ය තොරතුරු ඇතුළත් පුවත්පතේ නම, දිනය වැනි මූලික තොරතුරු රැගෙන පැමිණීම අදාළ තොරතුරු ඉක්මණින් ලබා ගැනීමටත් අනවශ්‍ය පුවත්පත් පරිශීලනය වළක්වා ගැනීමටත් මහෝපකාරි වේ .

ජාතික පුස්තකාලය සතු පුවත්පත් එකතුව පාඨක ඔබගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් විවෘතව පවතින්නකි. එය අද දින ඔබ සඳහා මෙන්ම අනාගත පරපුර වෙනුවෙන් ද ආරක්ෂා විය යුතු වේ.

මෙම පුවත්පත් මාස අනුපිළිවෙලට පෙට්ටිවල තැන්පත් කර ඇත. එම පෙට්ටි රාක්කවලින් පිටතට ගැනීමත්, ආපසු තැන්පත් කිරිමත්, අවුල් වූ පුවත්පත් නැවත සකස් කිරීමත් ඉතාමත් වෙහෙසකර හා කාලය වැයවන කාර්යයකි. එබැවින් ඔබට අවශ්‍ය පුවත්පත් පිළිබඳ තොරතුරු නිවැරදිව ඉදිරිපත් කොට අවශ්‍ය පුවත්පත් පමණක් ලබා ගැනීමට කාරුණික වන්න.

පසුගිය වසර ගණනාවක පුවත්පත්වල පළ වූ ලිපි පිළිබඳ තොරතුරු ඇතුළත් පුවත්පත් ලිපි අනුක්‍රමණිකා (News paper Article Index) අප විසින් සම්පාදනය කර ඇත. ඒවා පරිශීලනය කිරීමෙන් තමන්ට අවශ්‍ය තොරතුරු හඳුනාගෙන පසුව අදාළ පුවත්පත් පමණක් පරිශීලනය කළ හැක. මෙම පුවත්පත් අනුක්‍රමණිකා පිළිබඳ තොරතුරු කාර්ය මණ්ඩලයෙන් ලබාගත හැක.

මෙම වටිනා එකතුව පරිහරණයේ දී පුවත්පත්වලට හානි සිදුවන ආකාරයෙන් පරිහරණය කිරීම පිටු ඉරා හෝ රැගෙන යාමෙන් වළකින මෙන් කාරුණිකව දන්වමි. එසේ ම පුවත්පත් ආපසු භාරදීමේ දී ඒවා අවුල් නොකොට පිටු නියමිත පිළිවෙලට සකසා භාරදීම විශාල පහසුවක් වේ.

# පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම

| | | | |
|---|---|---|---|
| පෙබරවාරි | 21 | - | ජාත්‍යන්තර මව් භාෂා දිනය (UNESCO) |
| මාර්තු | 21 | - | ලෝක කවි දිනය (UNESCO) |
| අප්‍රේල් | 02 | - | ලෝක ළමා පොත් දිනය (IBBY) |
| අප්‍රේල් | 07 | - | ලෝක සෞඛ්‍ය දිනය (WHO) |
| අප්‍රේල් | 23 | - | ලෝක පොත් හා ප්‍රකාශන හිමිකම් දිනය (UNESCO) |
| මැයි | 03 | - | ලෝක පුවත්පත් නිදහස් දිනය (UNESCO) |
| මැයි | 17 | - | ලෝක විදුලි සංදේශ දිනය (ITU) |
| මැයි | 21 | - | ලෝක සංස්කෘතික දිනය (UNESCO) |
| ජූනි | | - | (පොසොන්) මාසයේ පළමු සඳුදා දිනයෙන් ඇරඹෙන සතියේ දෙවන දිනය (අඟහරුවාදා) - පිරිවෙන් පුස්තකාල දිනය (NLDSB) |
| ජූනි | 05 | - | ලෝක පරිසර දිනය (UNEP) |
| ජූලි | | - | පළමු සඳුදා දිනයෙන් ඇරඹෙන සතිය - පළාත් පාලන සතිය (පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය) |
| ජූලි | | - | පළමු සඳුදා දිනයෙන් ඇරඹෙන සතියේ දෙවන දිනය - මහජන පුස්තකාල දිනය (NLDSB) |
| අගෝස්තු | 09 | - | ආදි වාසීන්ගේ දිනය (UNESCO) |
| අගෝස්තු | 12 | - | ජාත්‍යන්තර යොවුන් දිනය (UNESCO) |
| සැප්තැම්බර් | | - | සාහිත්‍ය මාසය |
| සැප්තැම්බර් | 08 | - | ජාත්‍යන්තර ලේඛක දිනය හා ලෝක සාක්ෂරතා දිනය (UNESCO) |
| ඔක්තෝබර් | | - | ජාතික කියවීමේ මාසය (NLDSB) (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් 2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ) |
| ඔක්තෝබර් | 01 | - | ජාත්‍යන්තර වැඩිහිටි දිනය හා විශ්ව ළමා දිනය (UNESCO) |
| ඔක්තෝබර් | | - | සඳුදා දිනයෙන් ඇරඹෙන පළමු සතිය පුස්තකාල සතිය (NLDSB) පුස්තකාල සතියේ දෙවන දිනය - පුස්තකාලයාධිපතීන්ගේ දිනය (NLDSB) |
| ඔක්තෝබර් | 05 | - | ලෝක ගුරු දිනය (UNESCO) |
| ඔක්තෝබර් | 10 | - | ලෝක මානසික සෞඛ්‍ය දිනය |
| ඔක්තෝබර් | 24 | - | එක්සත් ජාතින්ගේ දිනය හා ලෝක තොරතුරු සංවර්ධනය කිරීමේ දිනය (UNO) |
| ඔක්තෝබර් | | - | 4 වන සඳුදා දිනයෙන් ඇරඹෙන සතිය පාසල් පුස්තකාල සතිය (අධ්‍යාපන අමාත්‍යාංශය) |
| ඔක්තෝබර් | | - | 4 වන සතියේ සඳුදා දිනය - විශ්ව පාසල් පුස්තකාල දිනය (IASL) |
| නොවැම්බර් | 21 | - | ලෝක රූපවාහිනී දිනය (UNESCO) |
| දෙසැම්බර් | 10 | - | මානව හිමිකම් දිනය |

178834

# වෙනත් විශේෂ දින

| | | |
|---|---|---|
| ජනවාරි | 04 | - ලුවී බ්‍රේල් දිනය |
| පෙබරවාරි | 04 | - ජාතික නිදහස් දිනය |
| පෙබරවාරි | 22 | - ලෝක බාලදක්ෂ දිනය |
| මාර්තු | 02 | - සිංහල භාෂා දිනය |
| මාර්තු | 08 | - ජාත්‍යන්තර කාන්තා දිනය |
| මාර්තු | 14 | - ජගත් දුම්රිය දිනය, ඡායාරූප ශිල්පීන්ගේ දිනය |
| මාර්තු | 15 | - ජගත පාරිභෝගික දිනය |
| මාර්තු | 22 | - ලෝක ජල දිනය |
| මාර්තු | 23 | - ලෝක කාලගුණ විද්‍යා දිනය |
| අප්‍රේල් | 22 | - ජගත් මිහිතල දිනය |
| මැයි | 01 | - ජාත්‍යන්තර කම්කර දිනය (මැයි දිනය) |
| මැයි | 14 | - ලෝක මව්වරුන්ගේ දිනය |
| මැයි | 18 | - ජාත්‍යන්තර කෞතුකාගාර දිනය |
| මැයි | 22 | - ලෝක ජෛව විවිධත්ව දිනය |
| මැයි | 31 | - ලෝක දුම්වැටි විරෝධී දිනය |
| ජුනි | 14 | - ලෝක ලේ දන්දීමේ දිනය |
| ජුනි | 20 | - ලෝක සරණාගතයින්ගේ දිනය |
| ජුනි | 26 | - ජාත්‍යන්තර මත් ද්‍රව්‍ය විරෝධී දිනය |
| ජුලි | 01 | - ජාත්‍යන්තර සමූපකාර දිනය |
| ජුලි | 11 | - ලෝක ජනගහන දිනය |
| සැප්තැම්බර් | 08 | - පුවත්පත් කලාවේදීන්ගේ දිනය |
| සැප්තැම්බර් | 27 | - ලෝක සංචාරක දිනය |
| ඔක්තෝබර් | 03 | - ලෝක අමද්‍යප දිනය |
| ඔක්තෝබර් | 04 | - ලෝක සත්ත්ව අවිහිංසා දිනය |
| ඔක්තෝබර් | 09 | - ලෝක තැපැල් දිනය |
| ඔක්තෝබර් | 15 | - සුදු සැරයටි දිනය |
| ඔක්තෝබර් | 16 | - ලෝක ආහාර දිනය |
| ඔක්තෝබර් | 24 | - එක්සත් ජාතීන්ගේ දිනය |
| නොවැම්බර් | 11 | - පොපි මල් දිනය |
| දෙසැම්බර් | 01 | - ලෝක ඒඩ්ස් දිනය |
| දෙසැම්බර් | 03 | - ජාත්‍යන්තර ආබාධිත දිනය |
| දෙසැම්බර් | 11 | - ජාත්‍යන්තර ළමා සන්නිවේදන දිනය |

# ජාතික පුස්තකාලය මගින් පොත්පත් හා අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය නිකුත් කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පර්යේෂණ පුස්තකාලයක් බැවින් පොත්පත් ඇතුලු අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය පාඨකයින් වෙත නිකුත් කරනු ලබන්නේ විමර්ශන කටයුතු සඳහා පමණි. කිසිඳු හේතුවක් නිසා ඒවා බැහැර දිමක් සිදු නොකෙරේ.

- මූලික විමර්ශන ග්‍රන්ථ එකතුව බිම් මහලේ විවෘත ප්‍රවේශ ක්‍රමය යටතේ පවතින අතර ඒවා එම මහලේ සිට පරිහරණය කළ හැකිය. අනෙකුත් සියලුම පුස්තකාල ද්‍රව්‍ය පුස්තකාලය අභ්‍යන්තරයෙහි තැන්පත් කර තිබේ.

- 1976 වසරේ සිට මෙරට තුළ පළ වූ ජාතික පුවත්පත් හා පුස්කොළ පොත් එකතුව ද බිම් මහලේ දී විමර්ශනය කළ හැකිය.

- අනෙකුත් විෂයයන්ට අදාළ පොත්පත් සඟරා ගැසට් පත්‍ර හැන්සාඩ් වාර්තා ආදිය පළමු හා දෙවන මහල්වල දී විමර්ශනය කිරීමේ පහසුකම් සලසා තිබේ.

- ග්‍රන්ථ එකතු පවතින ප්‍රදේශයට ඇතුළත් විය හැක්කේ ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලයට පමණි.

- පොත් හා අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු මහල් තුනෙහිම ස්ථාපිත කොට තිබෙන පරිගණක සුචි (Computer Catalogue) ආශ්‍රයෙන් පරික්ෂා කළ හැකිය. අවශ්‍ය පොතපත හඳුනාගත් පසු පුස්තකාල ද්‍රව්‍ය ඇණවුම් පතෙහි (Call Slip) එය සඳහන් කොට කවුන්ටරයේ සිටින කාර්ය මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසු අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය ලබා ගත හැකිය.

- එක් අවස්ථාවක දී පාඨකයෙකු සඳහා නිකුත් කරනු ලබන්නේ පොත් තුනක් (03) පමණක් වන අතර එම පොත් නැවත බාරදීමෙන් පසු තවදුරටත් පොත් ඉල්ලුම් කළ හැකිය.

- ලබාගත් පොතපත නිකුත් කිරීමේ කවුන්ටරය වෙත නැවත භාරදෙන තෙක් ඒවායේ වගකීම පාඨකයින් විසින් දැරිය යුතු වේ.

- පොතපත පරිශීලනය කොට නැවත පුස්තකාලයෙන් බැහැරට යන විට භාරගත් පොත් පත් සියල්ල නිකුත් කිරීමේ කවුන්ටරයට බාරදුන් බවට "පුස්තකාල ද්‍රව්‍ය ඇනවුම් පතෙහි" සහතික කරගත යුතු අතර මණ්ඩලයේ ආරක්ෂක අංශය භාරයේ තබන ලද ඔබගේ හැඳුනුම්පත ලබා ගැනීමේ දී එම ඇනවුම් පත ආරක්ෂක නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය.

# මණ්ඩලයීය ප්‍රකාශන

| | | | |
|---|---|---|---|
| 1. | ජාතික ග්‍රන්ථ නාමාවලිය | - | 100.00 |
| 2. | වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව | - | 100.00 |
| 3. | රජයේ ප්‍රකාශන නාමාවලිය | - | 200.00 |
| 4. | පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව | - | 375.00 |
| 5. | පුස්තකාල ප්‍රවෘත්ති | - | 50.00 |
| 6. | ඩිවි දශම වර්ගීකරණය (සිංහල) | - | 300.00 |
| 7. | Index to Research Report ( 2005-2009) | - | 260.00 |
| 8. | Directory of Libraries in Sri Lanka (2010) | - | 250.00 |

**මෙම ප්‍රකාශන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අලෙවිහලෙන් ලබා ගත හැකිය.**

**විමසීම් - 0112698847 / 0112685197**

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
# පුස්තකාල ලිපි ද්‍රව්‍ය මිල ගණන්

| | | | | |
|---|---|---|---|---|
| 1. | දින පත්‍රිකා (සිංහල දෙමළ) | - 100 - | රු. | 50.00 |
| 2. | දින පත්‍රිකා (ඉංග්‍රීසි) | - 100 - | රු. | 60.00 |
| 3. | පොත් තුණ්ඩු (සිංහල දෙමළ ඉංග්‍රීසි) | - 100 - | රු. | 70.00 |
| 4. | පොත් සාක්කු | - 100 - | රු. | 125.00 |
| 5. | සාමාජික බලපත්‍ර (සිංහල දෙමළ ඉංග්‍රීසි) | - 100 - | රු. | 140.00 |
| 6. | සාමාජික අයදුම්පත් (සිංහල දෙමළ ඉංග්‍රීසි) | - 100 - | රු. | 150.00 |
| 7. | සුචි පත්‍රිකා | - 100 - | රු. | 50.00 |
| 8. | පරිග්‍රහණ ලේඛන (පිටු 600) | - 01 - | රු. | 1500.00 |
| 9. | පරිග්‍රහණ ලේඛන (පිටු 300) | - 01 - | රු. | 900.00 |
| 10. | නියමු ලේබල් (පැකට්) | - 01 - | රු. | 65.00 |
| 11. | සංවෘත්ත පුස්තිකා පෙට්ටි | - 01 - | රු. | 265.00 |
| 12. | විවෘත පුස්තිකා පෙට්ටි | - 01 - | රු. | 200.00 |
| 13. | කාඩ් ට්‍රේ | - 01 - | රු. | 1550.00 |
| 14. | පොත් ට්‍රොලි | - 01 - | රු. | 1750.00 |

මෙම ප්‍රකාශන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ

අලෙවිහලෙන් ලබා ගත හැකිය.

චෙක්පත් මගින් ගෙවන්නේ නම් අදාළ චෙක්පත,

**"සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය"**

නමට ලිවිය යුතු වේ.

විමසීම් - 0112698847 / 0112685197


# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

**සේවාවන්**

විමර්ශන, ලේඛන සැපයීම්, අන්තර් පුස්තකාල පිරුළු සේවා, ග්‍රන්ථ විඥාපන සේවාව, ජාතික ඒකාබද්ධ සූචිය, යොමුගත සේවාව, ඡයා පිටපත් සේවා, අන්තර්ජාල පහසුකම්,

එකතූන්

- විමර්ශන ග්‍රන්ථ - විශ්වකෝෂ, ශබ්ද කෝෂ, වාර්ෂික ග්‍රන්ථ
- සිතියම් එකතුව
- දුර්ලභ කෘති එකතුව
- පුවත්පත් (1976 වසරේ සිට) සිංහල, දෙමළ, ඉංග්‍රීසි (දේශීය පුවත්පත් පමණි)
- වාර සඟරා - දේශීය සහ විදේශීය
- ජාතික සහ අන්තර්ජාතික ප්‍රවෘත්ති සඟරා
- විද්‍යා හා තාක්ෂණික ග්‍රන්ථ එකතුව
- යුනෙස්කෝ පොත් එකතුව
- පැරණි පුස්කොළ පොත් එකතුව
- ශ්‍රී ලංකා එකතුව
- විද්‍යුත් මාධ්‍ය එකතුව
- ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව
- රජයේ ප්‍රකාශන එකතුව
- පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව
- නිබන්ධන එකතුව
- ජනශ්‍රැති එකතුව
- නීත්‍යානුකූල තැන්පතු එකතුව




ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය සඳුදා සිට සෙනසුරාදා දක්වා විවෘතව පවතී

විවෘතව තබන වේලාවන්

සඳුදා, බදාදා, සිකුරාදා සහ සෙනසුරාදා දිනවල පෙ.ව.8.30 සිට ප.ව. 4.15 දක්වා
අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනවල පෙ.ව.8.30 සිට ප.ව. 6.15 දක්වා

| | | |
|---|---|---|
| සාමාජික ගාස්තු | දිනකට | : රු. 20.00 |
| | මාස 03 කට | : රු. 100.00 |
| | අවුරුදු 01 කට | : රු. 350.00 |
| | යාවජීව සාමාජිකත්වය | : රු. 1000.00 |
| | ආයතනික සාමාජිකත්වය (වසරක් සඳහා) | : රු. 2500.00 |

විස්තර සඳහා

අංශ ප්‍රධාන
පාඨක සේවා අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
අංක 14 නිදහස් මාවත
කොළඹ 07

දුරකථන අංක : 011-2674386 011-2685197
ෆැක්ස් : 011-2685201
වෙබ් අඩවිය : http://www.natlib.lk
ඊ මේල් : reder@mail.natlib.lk

# සිංහල අවුරුදු පොත් ප්‍රදර්ශනයේ අවස්ථා






National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/12

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ...........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ...........

Date : 2017/10/12

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*